# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2293/33 - 2022 අගෝස්තු මස 17 වැනි බදාදා - 2022.08.17

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්. ඩී. - බී. 6/2017 (i)

**2002 අංක 34 දරන ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරී පනත**

9 වන වගන්තිය යටතේ වූ නියමය

2002 අංක 34 දරන ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරී පනතේ 9 වන වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍ය නිමල් සිරිපාල ද සිල්වා වන මා විසින්, මේ නියමය මගින්, 2016 ජූලි මස 01 වන දින අංක 1973/78 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද නියමය පහත දැක්වෙන පරිදි සංශෝධනය කරනු ලැබේ:-

(1) “උක්ත පනතේ දෙවන උපලේඛනයේ ගගන යාත්‍රාංගන යටතේ ලේඛනගතව ඇති මඩකලපුව ගුවන්තොටුපළ ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරිය වෙත වහාම ක්‍රියාත්මක වන පරිදි පවරා සතුකර දෙන බව මෙයින් දැනුම් දෙමි.” යන වචන වෙනුවට “එකී පනතේ දෙවන උපලේඛනයේ නිශ්චය කොට දැක්වෙන මඩකලපුව ගුවන් තොටුපළ ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරිය වෙත වහාම ක්‍රියාත්මක වන පරිදි පවරා සතුකර දෙමි.” යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(2) “වහාම ක්‍රියාත්මක වන පරිදි පවරා සතුකර දෙමි.” යන එකී වචනවලට ඉක්බිතිවම පහත දැක්වෙන උපලේඛනය ඇතුළත් කිරීමෙන්:-

“උපලේඛනය

මඩකලපුව දිස්ත්‍රික්කයේ මන්මුණේ උතුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ 181ඩී - වෙට්ටිකුඩා ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ පිහිටි P. P./මඩ/2972 අංක දරන මිනින්දෝරු සැලැස්මෙහි කැබලි අංක 1 මගින් නිරූපිත බෙදා වෙන් කරන ලද හෙක්ටයාර් 77.7301ක ප්‍රමාණයකින් සමන්විත වන්නා වූ ඉඩම් කොටස සහ එකී සැලැස්මට අනුව එකී කැබලි අංක 1ට මායිම්,


*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

*උතුරට* : බාබදයිවේලි, P. P. මඩ 836 අංක දරන සැලැස්මේ කැබලි අංක 1, TP 253659, TP 177256 සහ P. P. මඩ 2604 අංක දරන සැලැස්මේ කැබලි අංක 3;

*නැගෙනහිරට* : P. P. මඩ 2604 අංක දරන සැලැස්මේ කැබලි අංක 3, 4 සහ 2;

*දකුණට* : P. P. මඩ 2604 අංක දරන සැලැස්මේ කැබලි අංක 2 සහ 1; සහ

*බටහිරට* : P. P. මඩ 2604 අංක දරන සැලැස්මේ කැබලි අංක 1, බාබදයිවේලි, P. P. මඩ 836 අංක දරන සැලැස්මේ කැබලි අංක 1, TP 253659 සහ TP 177256.".

**නිමල් සිරිපාල ද සිල්වා,**
වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍ය.

2022 අගෝස්තු මස 08 වැනි දින,
කොළඹ දී ය.

EOG 08-0151

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.